# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1587 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 16/10 /2024
පැය 0600

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට - ජාඇල පොලිස් වසම.

2024.10.14 වන දින දහවල් කාලයේදී ජාඇල පොලිස් වසමේ ඒකල ප්‍රදේශයේ මාර්ගයේ ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් තුවාල ලබා රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට ජාඇල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර තිබිණි.

ඒ අනුව සිද්ධියට සම්බන්ධ සැකකරු හා මනුෂ්‍ය ඝාතනය සිදුකිරීමට ආධාර අනුබල දුන් සැකරුවන් 04 දෙනෙකු ජාඇල පොලිස් ස්ථානයේ නිළධාරීන් විසින් 2024.10.15 වන දින අළුයම් කාලයේදී සහ සවස් කාලයේදී අත්අඩංගුවට ගෙන ඇත. තවද පහරදීමට යොදා ගන්නා ලද මන්නා පිහි දෙකක්, ලී පොලු 04 ක් සහ ඇලුමිනියම් බට දෙකක් පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22, 33, 45, 48 හා 65 යන වයස්වල පසු වන ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. **මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - නිකවැරටිය පොලිස් ස්ථානය.**

2024.10.11 වන දින උදෑසන කාලයේ පල්ලම පොලිස් වසමේ ආඬිගම රස්නායකපුර මාර්ගයේ කාලයාගම ප්‍රදේශයේ මාර්ගයේ නාඳුනන පිරිමි පුද්ගලයෙකු වැටී සිටින බවට ලද පණිවිඩයක් මත පල්ලම පොලිසිය විමර්ශන ආරම්භ කර එම නිලධාරීන් විසින් මෙම පුද්ගලයා හලාවත රෝහලට ඇතුලත් කර ඇති අතර එහිදී වෛද්‍යවරුන් විසින් මෙම පුද්ගලයා මියගොස් ඇති බවට වාර්තා කර ඇත. පසුව මෘත දේහය ඥාතීන් විසින් හඳුනාගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 68 ක් වූ ගලපිටියාගම, නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙම පුද්ගලයා නිවසින් පිටව ගොස් නැවත නිවසට නොපැමිණීම සම්බන්ධයෙන් නිකවැරටිය පොලිස් ස්ථානයට ලද පැමිනිල්ලක් මත නිලධාරීන් කණ්ඩායමක් යොදවා විමර්ශනයක් සිදුකර කර ඇත. එහිදී මෙම මරණකරු ප්‍රතිකාර ලබාගැනීම සඳහා නිකවැරටිය රෝහලට පාපැදියෙන් ගමන් කරමින් සිටියදී, ආඬිගම නබඩෑව මාර්ගයේ දියගම ප්‍රදේශයේදී ලොරි රථයකින් හප්පා මරණකරු රෝහලට යොමු නොකර ලොරි රථයෙන්ම රැගෙන ගොස් පල්ලම පොලිස් වසමේ ආඬිගම රස්නායකපුර මාර්ගයේ තේක්ක වත්ත ප්‍රදේශයේ දමාගොස් ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. ඒ අනුව මෙම මනුෂ්‍ය ඝාතනයට සම්බන්ධ ලොරි රථයේ රියදුරු සහ රිය සහායක 2024.10.14 වන දින සවස් කාලයේ නිකවැරටිය පොලිස් වසමේ නිකවැරටිය නගරයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 හා 52 වයස් වල පසු වන නැගම්පහ සහ කොස්ගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

නිකවැරටිය හා පල්ලම පොලිස් ස්ථාන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මාවතගම පොලිස් ස්ථානය.**

2024.10.15 වන දින උදෑසන කාලයේ මාවතගම පොලිස් වසමේ කොටිකාපොල ප්‍රදේශයේදී මාවතගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත යතුරුපැදියක් පරීක්ෂා කිරීමේදී **අයිස් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 100 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දීර්ඝ ලෙස ප්‍රශ්න කිරීමෙන් පසු අනාවරණය වූ තොරතුරු මත මාවතගම, කොටිකාපොල ප්‍රදේශයේ නිවසක සිටි තවත් පුද්ගලයෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලි ග්‍රෑම් 700 ක්** සන්තකයේ තබාගෙන සිටියදී අත්අඩංගුවට ගෙන ඇත. යතුරුපැදියද පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 හා 32 වයස්වල පසුවන වැඋඩ හා මාවතගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මාවතගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.10.15 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ වටරප්පල මාවතේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 500 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින්, අයිස් මත්ද්‍රව්‍ය සහ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රුවන්වැල්ල පොලිස් ස්ථානය.

2024.10.15 වන දින සවස් කාලයේ රුවන්වැල්ල පොලිස් වසමේ ඉඹුලාන ප්‍රදේශයේදී රුවන්වැල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 500 ක්, අයිස් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 600 ක් සහ ගංජා ග්‍රෑම් 01 මිලි ග්‍රෑම් 500 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන ඉඹුලාන, රුවන්වැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

රුවන්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. නීති විරෝධී මත්පැන් හා නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය.

2024.10.15 වන දින අළුයම් කාලයේදී පමුණුගම පොලිස් වසමේ මුතුරාජවෙල වගුරුබිම් ප්‍රදේශයේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 101 මිලි ලීටර් 250 (බෝතල් 135) ක් සහ නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 8505 (බැරල් 45) ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන කලළුළිය, ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - පේරාදෙණිය පොලිස් වසම.

2024.10.15 වන දින සවස් කාලයේ පේරාදෙණිය පොලිස් වසමේ පේරාදෙණිය උද්භිද උද්‍යානය අසල බස්නැවතුම්පොලක් තුළ පුද්ගලයෙකු වැටී සිටින බවට ලද පණිවිඩයක් මත පේරාදෙණිය පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත. පොලිස් නිලධාරීන් විසින් මෙම පුද්ගලයා පේරාදෙණිය රෝහලට ඇතුලත් කර ඇති අතර එහිදී වෛද්‍යවරුන් විසින් මියගොස් ඇති බවට දන්වා ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර වයස අවුරුදු 70 ක් පමණ වන උස අඩි 05 යි අඟල් 05 ක් පමණ වන පුද්ගලයෙකු වන අතර හිසකෙස් අඟල් 02 ක් පමණ වැවී ඇත. මුහුණේ සම්පූර්ණයෙන්ම රැවුල වැවී සුදු**

**පැහැ ගැන්වී ඇත. උඩුකය නිරුවත්ව ඇති අතර සුදු පැහැති සරමක් හැඳ සිට ඇත.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පේරාදෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පේරාදෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. බඹර ප්‍රහාරයක් - නෝර්වුඩ් පොලිස් වසම.

2024.10.15 වන දින දහවල් කාලයේ නෝර්වුඩ් පොලිස් වසමේ ඉන්ජස්ට්‍රි වත්ත ප්‍රදේශයේ බඹර කූඩයක් ඇවිස්සීමෙන් තේ දළු නෙළමින් සිටි පුද්ගලයෙකු හා කාන්තාවක් බඹර ප්‍රහාරයට ලක්ව තුවාල ලබා දික්ඔය රෝහලට ඇතුලත් කර ඇත.

තුවාල ලැබූ පුද්ගලයා තවදුරටත් රෝහලේ ප්‍රතිකාර ලබන අතර කාන්තාව ප්‍රතිකාර වලින් පසු රෝහලින් බැහැරව ගොස් ඇත. නෝර්වුඩ් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - මරදන්කඩවල පොලිස් වසම.

2024.10.15 වන දින උදෑසන කාලයේ මරදන්කඩවල පොලිස් වසමේ මරදන්කඩවල හබරණ මාර්ගයේ ගනේවල්පොල ප්‍රදේශයේදී මරදන්කඩවල දෙස සිට හබරණ දෙසට ධාවනය වූ ලොරි රථයක් අතුරු මාර්ගයක සිට ප්‍රධාන මාර්ගයට පිවිසි යතුරුපැදියක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු හා පසුපැදිකරු ප්‍රතිකාර සඳහා කැකිරාව රෝහලට ඇතුලත් කිරීමේදී යතුරුපැදිකරු මියගොස් ඇත. පසුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 68 ක් වූ පඬිකාරමඩුව, ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කැකිරාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධියට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මරදන්කඩවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**